අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | Fax +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/01/11/01/19-2024 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2024.05. 07 |

**චක්‍රලේඛ අංක : 18/2024**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා,
සියලුම සීලමාතා ආයතනාධිපතිවහන්සේලා,
සියලුම විදුහල්පතිවරුන්,

## ශ්‍රී බුද්ධ වර්ෂ 2568 වන වෙසක් සතිය

2024 මැයි මස 23 වන දිනට යෙදී ඇති ශ්‍රී බුද්ධ වර්ෂ 2568 වන වෙසක් දිනය නිමිත්තෙන් සංවිධිත රාජ්‍ය වෙසක් උත්සවය 2024 මැයි මස 21 වන දින මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ධර්මරාජ පිරිවෙන් විහාරස්ථානයේ දී පැවැත්වීමට බුද්ධ ශාසන අමාත්‍යාංශය කටයුතු යොදා ඇත.

රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව, "වෙසක් සතිය" වැඩසටහන, අදාළ පාසල්, විද්‍යාපීඨ, පිරිවෙන් හා ගුරු විද්‍යාල පරිශ්‍රයන්හි , 2024.05.20 වන දින සිට 2024.05.26 වන දින දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සංවිධානය කළ යුතු වේ.

මෙම වෙසක් සතිය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ආදර්ශ සැලැස්ම පහතින් ඉදිරිපත් කර ඇති අතර එම වැඩසටහන් අදාළ පාසල් සහ අධ්‍යාපන ආයතනවල සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු සලසන මෙන් ඉල්ලමි.

**මෙවර වෙසක් සතිය සඳහා යෝජිත තේමාව වන්නේ,**

**"අත්තනො ව අවෙක්ඛෙය්‍ය කතානි අකතානි ච"**
**("අනුන් කළ දේ නොව තමන් කළ දේ ගැන විමසිලිමත් වෙමු".)**

**යෝජිත වෙසක් සතියේ ආදර්ශ වැඩ සැලැස්ම.**

| දිනය | තේමාව | යෝජිත ක්‍රියාකාරකම් |
|---|---|---|
| 2024 මැයි මස 20 වන සඳුදා | **"තිරසර පරිසරයක් සඳහා බුදුදහම"**<br>**පරිසර සංරක්ෂණ වැඩසටහන්** | • බුදුරජාණන්වහන්සේගේ ඉගැන්වීම් ඇසුරින් පරිසර හිතකාමී පිරිසක් බිහි කිරීම සඳහා පරිසරයේ වටිනාකම හා පරිසරය රැක ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• පාසල, ආයතනය, ආගමික සිද්ධස්ථාන, නිවස ආදියෙහි අවට පිරිසිදු කිරීම් සහ වෙසක් පහන් කූඩු(ඉටිකොල භාවිතයෙන් තොරව) සකස් කිරීම සහ සැරසීම.<br>• "සති භාවනා" වැඩසටහන පැවැත්වීම. |
| 2024 මැයි මස 21 වන අඟහරුවාදා | **"සිල් සුවඳින් නිරතුරු කුසල් රැස් කරන්න" සීල භාවනා පිංකම්** | • අධ්‍යාත්මික සංවර්ධනය සඳහා සිසු සිසුවියන්ට සීල භාවනා වැඩසටහන් පැවැත්වීම තුළින් ප්‍රතිපත්ති පූජා වල ආනිශංස පිළිබඳ හුරුව ලබා දීම. |

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister — +94112784832, Fax +94112784825, minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary — +94112784811, Fax +94112785162, secretary.education@moe.gov.lk

| | | |
|---|---|---|
| 2024 මැයි මස 22 වන බදාදා | "සාරධර්ම ප්‍රවර්ධනය" හා ආගමික සහජීවන වැඩසටහන, සහ "බුදු තෙමඟුල අර්ථාන්විතව සමරමු." | • බුදු දහම හා සිරිත් විරිත්, සාරධර්ම පිළිබඳ අවබෝධයක් ලබා දීම සහ සිසු සිසුවියන් තුළ සතිමත් බව වර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණ වැඩසටහන් සංවිධානය කිරීම සහ ආරෝග්‍යශාලා හා වැඩිහිටි නිවාස, ළමා නිවාස ආදියෙහි සමාජ සත්කාරක වැඩසටහන් සංවිධානය කිරීම.<br>• "බුදු තෙමඟුල අර්ථාන්විතව සමරමු" යන මැයෙන් පාසල් සිසුන් සඳහා වෙසක් මාසය තුළ පද්‍ය රචනා (සදැස්) තරඟයක් පැවැත්වීම සහ ඇගයීම. |
| 2024 මැයි මස 23 වන බ්‍රහස්පතින්දා (වෙසක් පුර පසළොස්වක පොහෝ දිනය) | "කායික වාචසික සංවරය සීලයයි" (කාය වාචානං සමොදානං සීලං) | • දෙමව්පියන් සහ වැඩිහිටියන් සමඟ ආසන්නතම විහාරස්ථානයේදී හෝ නිවසේදී සිල් සමාදන් වීම හෝ සිල් සමාදන් වූ උවැසි උවැසියන්ට උපස්ථාන කිරීම.<br>• වෙසක් පහන් කූඩු වලින් නිවස අලංකාර කර ආමිස පූජා සිදු කිරීම.<br>• පාසල තුළ වෙසක් බැති ගීත වැඩසටහන් සංවිධානය කිරීම. |
| 2024 මැයි මස 24 වන සිකුරාදා | "අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන" | • දෙමව්පියන් සහ වැඩිහිටියන් සමඟ ආමිස හා ප්‍රතිපත්ති පූජා වලට මුල්තැන දී කටයුතු කිරීම.<br>• වෙසක් පහන් කූඩු වලින් නිවස අලංකාර කර ආමිස පූජා සිදු කිරීම. |
| 2024 මැයි මස 25 වන සෙනසුරාදා | "සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා සම්බුද්ධ දේශනාවට අනුව පවත්වන වැඩසටහන" | • නිවසේදී සංනිවේදන මාධ්‍ය භාවිතයෙන් පහත කරුණු පිළිබඳව තොරතුරු සොයා දැනුම වර්ධනය කර ගැනීම.<br>*නිරෝගීභාවයේ සහ මානසික සුවතාවයෙහි වටිනාකම සිසු සිසුවියන්ට අවබෝධ කර ගැනීම.<br>*වස විසෙන් තොර දේශීය ආහාර භෝග වගා කිරීම හා පරිභෝජනයට ගැනීම සම්බන්ධව දේශන ශ්‍රවණය කිරීම.<br>• "සති භාවනා" වැඩසටහන් වලට යොමු වීම.<br>• වෙසක් පහන් කූඩු වලින් නිවස අලංකාර කර ආමිස පූජා සිදු කිරීම. |
| 2024 මැයි මස 26 වන ඉරිදා | "සංස්කෘතික වැඩසටහන" | • වැඩිහිටියන් සමඟ වෙසක් බැති ගී ගායනා හා බෞද්ධ නාට්‍ය වැනි සෞන්දර්යාත්මක වැඩසටහන් සඳහා සහභාගී වීම, නැරඹීම සහ රසවිඳීම. |

ඉහත වෙසක් සතිය තුළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී, ආයතනික වශයෙන් සුදුසු ලෙස දින සහ වේලාවන් යොදා ගත හැකිය. කුමන හේතුවක් නිසා හෝ බෞද්ධ ආගමට හා අන්‍යආගම් වලට නිගරු වන ආකාරයේ අදහස් දැක්වීම, සංදර්ශන හා ක්‍රීඩා සහ එවැනි වෙනත් වැඩසටහන් පැවැත්වීම ආදියෙන් වැලකිය යුතු වේ. සිසු සිසුවියන් හා පාසල්/ආයතන ප්‍රජාව අතර ආගමික සංහිඳියාව ගොඩනැගෙන අයුරින් කටයුතු කිරීමට විදුහල්පතිවරුන් සහ ආයතන බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය.

ජේ.එම්.තිලකා ජයසුන්දර
අධ්‍යාපන ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම් -ජනාධිපති ලේකම් කාර්යාලය
2. ලේකම් - බුද්ධ ශාසන, ආගමික සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
3. ප්‍රධාන ලේකම්වරුන් - සියලුම පළාත්
4. ලේකම් - දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

} කරු.දැ.ගැ .ස හා අ.ක. ස

5. විද්‍යාපීඨ කොමසාරිස් - සියලු විද්‍යාපීඨ දැනුවත් කිරීමට හා අ.ක.ස
6. ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ - සියලු ජාතික පාසල් දැනුවත් කිරීමට හා අ.ක.ස
7. පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ - සියලු පිරිවෙන් අධ්‍යාපන ආයතන දැනුවත් කිරීමට හා අ.ක.ස